# කතුවැකිය

තුසිත මලලසේකර

පුරාවිද්‍යාව ඉංග්‍රීසියෙන් හඳුන්වන්නේ ආර්කියෝලොජි (Archeology) ලෙසිනි. ඉංග්‍රීසි ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය එය අර්ථකථනය කරනුයේ "ස්ථාන කැනීම් සහ භෞතික ශේෂ විශ්ලේෂණය කිරීම තුළින් මානව ඉතිහාසය සහ ප්‍රාග්-ඉතිහාසය හැදෑරීමේ විද්‍යාව" ලෙසය. මෙම "ආර්කියොලොජි" යන වචනයද බොහෝ ඉංග්‍රීසි වචන මෙන්ම බිඳී විත් ඇත්තේ ග්‍රීක භාෂාවෙනි. ග්‍රීක භාෂාවෙන් " ආර්කියෝස්" (Arkhaios) යන්න "ඉපැරණි" නැතිනම් "පෞරාණික" යන අර්ථය ලබාදෙයි. එසේම ග්‍රීක ලෝගෝ (Logo) යන්න "විද්‍යා" අර්ථය ලබයි. එහෙයින් එය පෞරාණික විද්‍යාව හෙවත් පුරාවිද්‍යාව ලෙස අප හඳාරන විද්‍යාවන් අතරට එක්ව තිබේ.

පුරාවිද්‍යාවට සමීපම විෂය වන්නේ ඉතිහාසයය. ඉතාම සරලව, ඉතිහාසය යනු පැරණි නැතිනම් අතීත සිද්ධීන් පිළිබඳ විස්තර කිරීමක් ලෙස සලකතොත් පුරාවිද්‍යාව යනු ඉතිහාසයේ සඳහන් කරුණු ශක්තිමත් කිරීමට, නැවත සලකා බැලීමට මෙන්ම වෙනස් කිරීමටද ඉවහල් වන්නාවූ අධ්‍යන ක්ෂේත්‍රයකි. විශේෂයෙන්ම වංශ කතා ආදී ඉතිහාසය ලිඛිතව ලියා ඇති සාක්ෂි නොමැති විට ප්‍රාග් - ඓතිහාසික සහ පූර්ව - ඓතිහාසික කරුණු පෙළගස්වන්නේ පුරාවිද්‍යාත්මක සොයාගැනීම් තුළිනි.

උදාහරණයක් ලෙස ගතහොත් මානව පරිණාමය ගැන සක්සුදක්සේ නිගමනයකට එළැඹීමට යම් යම් අඩුපාඩු තවමත් පවතින සමයක ඉන්දුනීසියාවේ "හොබිට්" මෙන්ම අපගේ ෆාහියන්-ලෙන ආශ්‍රිත සැකිලි සොයාගැනීම් නොයෙකුත් නව නිගමනයන්ට එළැඹීමට අවස්ථාව සලසා ඇත. ඉතා මෑතදී ලුම්බිනි නුවර සිදුකළ පුරාවිද්‍යාත්මක කැණීම් මගින් භාරත ඉතිහාසයේ විශේෂයෙන්ම බෞද්ධ ඉතිහාසයේ නව පිළිගැනීම් ඇතිකිරීමට මෙන්ම දැනට පවතින පිළිගැනීම් ශක්තිමත් කිරීමටද සාක්ෂි හමුවෙමින් පවතින බව යුනෙස්කෝව ප්‍රකාශ කර ඇත.

පුරාවිද්‍යාව අද එකම තලයකට සීමානොවී විවිධ ප්‍රදේශවලට අතු විහිදුවමින් පැරණි ලෝකය, නව ලෝකය හා සම්බන්ධ කිරීමට වෙර දරයි. මානව පරිණාමයෙන් ඔබ්බට යමින් එහි පැවති ලෝහ කර්මාන්තය, බලශක්තිය, ගොඩනැගිලි ඉදිකිරීම්, සෞඛ්‍ය හා වෛද්‍ය පහසුකම් ඇතුළු විද්‍යාත්මක දැනුම් සම්භාරය මහ පොළොව තුළ සැඟවී තිබීමට ඉඩනොදී හෙළිදරව් කිරීමට දරන ප්‍රයත්නය තුළින් ඒ බව පෙනේ.

මිනිසා පිළිබඳ සැඟවුනු අතීත තොරතුරු අසන්නට, දකින්නට ලැබීම ඉතා මිහිරිය. උත්තේජ ජනකය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි බෝග වගාවන්ගෙන් පමණක් නොව විදුහුරු ශිල්ප ශාස්ත්‍රයන්ගෙන්ද පොහොසත්ව තිබූ රටක ඒ අතීතය ක්‍රමක්‍රමයෙන් එළි දකින විට පොපියන ජාත්‍යානුරාගය අප සැවොම වෙළාගනු නොඅනුමානය. මෙවර 'විදුරාව' කලාපය සිය තේමාව ලෙස 'පුරාවිද්‍යාව' තෝරාගත්තේ ඔබ අප දිනූ මේ දේශය පැරණි ලෝකය තුළ කොතරම් සාඩම්බරව සිටින්නට ඇත්ද යන්න වටහා දීමටය. එසේම අදාළ සියළු පුරාවිද්‍යාත්මක දත්ත හා තොරතුරු මෙවැනි කුඩා ප්‍රකාශයකින් ඉදිරිපත් කළ නොහැකිය. එනමුත් මෙම සඟරාව කියවන ඔබට මහාචාර්ය සෙනරත් පරණවිතාන විද්වතාණන් ඇතුළු එදා මෙදා තුළ දෙස්-විදෙස් සුපතළ පුරාවිද්‍යාඥයින් මෙරට සිදුකළ හා දැනටත් සිදුකරමින් පවතින පුරාවිද්‍යාත්මක කැණීම් හා ගවේෂණ දත්ත විශ්ලේෂණ මෙන්ම නිගමන ගැනත් සොයාබැලීමට සිත් පහළවනු ඇතැයි යන්න අපගේ විශ්වාසයය.